# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1802/16 - 2013 මාර්තු මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2013.03.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ දැන්වීම

ගම්පහ ප්‍රාදේශීය සභාව

ගම්පහ ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වන කුමාරපේලි ආරච්චිගේ ඉන්දික සමන් කුමාරපේලි මහතා ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ සාමාජිකයෙකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ ඔහුගේ සභික ධූරය ඔහු විසින් අතහැර ඇති බව ගම්පහ ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරී පතිරාජ ආරච්චිලාගේ සුනිල් සේනාරත්න වන මම (262 වැනි අධිකාරිය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

පී. ඒ. එස්. සේනාරත්න,
තේරීම්භාර නිලධාරී,
ගම්පහ ප්‍රාදේශීය සභාව.

2013 මාර්තු මස 12 වැනි දින,
ගම්පහ මැතිවරණ කාර්යාලයේ දී ය.

04 - 181

---

### ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම

මියයාම හේතු කොට ගෙන ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

මුහම්මදු යූනුසු අබ්දුල් ලතීබු නම් වූ සභිකයා අයත්වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු වන හීංබණ්ඩා චන්දර රත්න බංඩාර රාජකාරුණා මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී කරුණාසිංහ ජයරත්නගේ සම්පත් මාධව වන මම, හීංබණ්ඩා චන්දර රත්න බංඩාර රාජකරුණා මහතා ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

කේ. ජේ. එස්. මාධව,
තේරීම්භාර නිලධාරී,
ඉපලෝගම ප්‍රාදේශීය සභාව.

2013 මාර්තු මස 13 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
අනුරාධපුර.

04 - 182

1A - G 17454 — 360 (2013/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*